

# ‘හැට වසරක නිදහස් ගීතයක්’







ශ්‍රී ලංකාවේ හැටවන නිදහස් සංවත්සරය සැමරීම සඳහා මේ මාසයේ ශ්‍රී ලංකාවේ පමණක් නොව ශ්‍රී ලාංකිකයන් වාසය කරන විදේශ රටවල පවා විවිධ උත්සව පවක්වනු ලැබේ. සියවස් හතර හමාරක් තිස්සේම පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි යන ජාතිකයන්ට අනුපිළිවෙලින් යත්ව තිබූ ලංකාවට 1948 පෙබරවාරි 4 දින ඉංග්‍රීසීන් විසින් ලබාදුන් -නිදහස” ඇත්ත වශයෙන්ම නිදහසක් ද යන පැනය නිකර මගේ සිතට නගී. එයට හේතුව නම් අප එදා -මීට හැට වසරකට පෙර- ලැබුවායයි කියන නිදහස කුමක්ද කියා අද වනතුරු මට තේරුම් ගැනීමට නොහැකිවීම නිසාය. නිදහස හෝ නිදහස් සමා-ජයක් යන වදන්වල අර්ථය ලෙස මේ දකින්නේ කුමක්ද ? මිනිසාගේ මූලික අවශ්‍යතාවන් වන ආහාර, ඇඳුම් පැළඳුම්, නිවාස ආදිය සෑම පුරවැසියකුටම සපයා ඇති බියෙන් සැකෙන් තොර සාමකාමී සමාජයක ජීවත්වීමට සෑම දෙනෙකුටම ඉඩකඩ ලැබී ඇති සමාජයක් ය. පුගිය හැට වසර තුළ එවන් සමාජයක් අප රට තුළ ගොඩ නැගී නැත. එවන් නිදහස් සමාජයක් ගොඩනැගීම සඳහා වගකීම දැරූ රජය පාලකයන් විටින් විට නිදහස් සමාජයක් ගොඩනැගවීමට විවිධ අයුරින් උත්සහ දරා ඇතත් නිදහස් සාමකාමී සමාජයක් තවමත් අපේ රට වන ශ්‍රී

***<u>පසුගිය දශකයේදී රට පාලනය කිරීමේ බාරධූර කාර්යයට උරදීමට මහා සංඝරත්නයට ද උත්සුක වී ඇත. දේශපාලන පක්ෂයක් තුළින් පාර්ලිමේන්තුවට පිවිස රජයේ පාලන කටයුතුවලට හවුල් වීම ශ්‍රී ලංකාවේ මහ සඟරුවන ඇරඹූ උත්තම ක්‍රියාවන් ලෙස මා දකින්නේ. එම ප්‍රයත්නය මීට දෙදහස් පන්සිය වසරකටත් පෙර බුදුන් වහන්සේ විසින් අනුදැන වදාළ ‘‘චරත සුබාය” යන දහම් වැකිය ක්‍රියාවට නැංවීමක් ලෙස ද සැලකීමට පුළුවන.</u>***

ලංකාව තුළ ගොඩනැංවී නැත.

මගේ මේ අදහස බොහෝ ශ්‍රී ලාංකිකයා තුළ ඇතිවන අදහසක් බව මම දනිමි. 1948 දී ඉංග්‍රීසීන් අප රටට බරදුන් පසු එවකට ප්‍රකට කවියෙකුව සිටි ටිබෙට් ජාතික එස්. මහින්ද හිමිපාණන් ලියූ කවි පෙළක් මගින් උන්වහන්සේ ද එවැනිම අදහසක් පළකර ඇත. ඉංග්‍රීසීන් අපට ලබා දුන්නායයි කියන -නිදහස” ලැබුණු අළුතම වාගේ 1949 දී උන්වහන්සේ මුද්‍රනයෙන් පළ කළේ -නිදහස් දැහැන”කාව්‍ය සංග්‍රහයේ එන වක් පැදි පෙළක් ‘ජාතිකානුරාගය’ ලෙස නම් කර තිබේ. ඒ පැදි පෙළේ උනවහන්සේ දක්වා ඇත්තේ 1948 දී අපේ රට අපට බාරදුන් පසු ‘නිදහස’ ලඟා කරගැනීම සඳහා අප විසින් කළයුතු දේවල්ය. රට අපටම යලිත් වරක් භාරදුන් පසු නිදහස ළඟා කරගැනීම සඳහා උන්වහන්සේ කෙතරම් නොඉවසිලිවන්තව සිටියේද යන්න ඒ පැදි පෙළේ පළමු පැදියෙන්ම හෙළිවෙයි. එය මෙසේය.

මොන කරුමයද තව ඇහැරුණු බවක්     නැහැ
පැන පැන බියව මුළු වැදුමෙන් පළක්     නැහැ
දිනුමෙන් පැරදුමෙන් කෝකත් කමක්     නැහැ
එනු ඉදිරියට නැතහොත් නිදහසක්     නැහැ

මහින්ද හිමියන්ගේ පැදි පෙළෙන් පෙනී යන කරුණක් නම් 1948 දී අප ලැබුවායයි කියන ‘නිදහස’ නිදහසක් නොව ජාතික වහල් කමක් බවයි. වහල් කම අතැර ගොස් නියම නිදහස ලැබූ දින; මරණය පවා පිළිගැනීමට උන්වහන්සේ සූදානම් බව පෙනේ.

ඉදිතත් මොට ද මේ ජාතික වහල්     කමේ
මැරුණුත් හොඳයි නිදහස් නම් පුලුල්     බිමේ”

එම පදයේම ඊලඟ පේලි දෙකෙන් උන්වහන්සේ වැදගත් කරුණක් අපට මතක් කර දෙයි. එනම් 1948 පෙබරවාරි 4 දින අප ලබාගන්නේ නියම නිදහසක් නොව ජාතික වයල් කමක් බව අප විසින් අවබෝධ කර ගැනීමේ වැදගත්කමයි.

මෙය සිත් ගතොත් සිංහල යන නිමල්     නමේ
තෙදකින් යළිදු පැතිරෙයි ලොව මුළුල්ල     මේ”

නියම නිදහසක් භුක්ති විඳිය හැක්කේ පොදු මහජනතාවගේ දුගීකම නැතිකර දැමීමෙනි. පසුගිය හැටවසර තුළ අපේ රට පාලනය කල රාජ්‍ය නායකයන් දුගී දුප්පත් ජනයාගේ සුබ විහරණය සඳහා කිසියම් ඵලදායි ක්‍රමවත් වැඩපිළිවෙලක් ඉදිරිපත් කර තිබේද?තමන්ගේ සැප සම්පත් ගැන පමණක් හිතමින් දුගී ජනයාගේ එදිනෙදා ජීවිතය ගැන සහමුලින්ම අමතක කර දැමූ පාලකයන් පසුගිය තිස්වසර තුළදී අපේ රටේ සිටි බව බොහෝ දෙනෙකුට අමතකවිය නොහැකිය. එස්. මහින්ද හිමියන් ස්වකීය ‘ජාත්‍යානුරාගය’ පැදි පෙළ මේ අදහස ඉදිරිපත්කර ඇතත්,

කාමුක කුහක ලොකු අයගේ නපුරු     කමින්
බාගෙට මැරී ඉන්නා දුගියාගේ     නමින්”
යනුවෙනි.

පසුගිය දශකයේදී රට පාලනය කිරීමේ බාරධූර කාර්යයට උරදීමට මහා සංඝරත්නයට ද උත්සුක වී ඇත. දේශපාලන පක්ෂයක් තුළින් පාර්ලිමේන්තුවට පිවිස රජයේ පාලන කටයුතුවලට හවුල් වීම ශ්‍රී ලංකාවේ මහ සඟරුවන ඇරඹූ උත්තම ක්‍රියාවන් ලෙස මා දකින්නේ. එම ප්‍රයත්නය මීට දෙදහස් පන්සිය වසරකටත් පෙර බුදුන් වහන්සේ විසින් අනුදැන වදාළ -චරත සුබාය” යන දහම් වැකිය ක්‍රියාවට නැංවීමක් ලෙසද සැලකීමට පුළුවන. එස්. මහින්ද හිමිපාණන් තම පැදි පෙළ අවසන් කරන්නේ අපේ රටට වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම නිදහසක් ලැබීම සඳහා සඟ රුවනගේ කාර්යභාර්ය අලපට මතක් කර දෙමිනි. ඒ පැදිය මෙසේය.

සහන ලැබෙන තුරු ලංකාදීපය     ට
ගහන ගැහිලි හමුවෙයි සිහිවෙසින්     සිට
නහන රුපුන් නහමින් යම් ඉදිරිය     ට
මහණ කමත් බණ දහමත් එයයි     මට

එස්. මහින්ද හිමියන්ගේ 1949 දී ලියූ ‘ජාත්‍යානුරාගය’ නැමැති මේ පැදි පෙළ හැට වසරක් තිස්සේ ශ්‍රී ලංකිකයන්ට ලබා ගත නොහැකි වූ නිදහසට හේතු වූ කරුණු කාරණා කෙරින් අපගේ අවධානය යොමු කරන කාව්‍ය නිර්මාණයක් ලෙසය මට පෙනෙන්නේ. එබැවින් මෙම පැදි පෙළ ‘හැටවසරක නිදහස් ගීතයක්’ ලෙස සැලකීමේ අසාධාරණයක් තිබේද?







